# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2161/18 - 2020 පෙබරවාරි මස 03 වැනි සඳුදා - 2020.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### තුවක්කු ආඥපනත

බලපත්‍ර රහිත තුවක්කු භාරදීම සඳහා කාලසීමාවක් ප්‍රකාශයට පත්කිරීම

1920 අංක 06, 1945 අංක 12, 1947 අංක 07 දරන ආඥපනත් හා 1955 අංක 18 හා 22, 1975 අංක 38, 1980 අංක 08, 1981 අංක 50, 1996 අංක 22 දරන පනත්වලින් සංශෝධිත (182 වන අධිකාරිය) වූ තුවක්කු ආඥපනතේ 30 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, බලපත්‍ර රහිත තුවක්කු රජයට භාරදීම සඳහා මුලු දිවයිනටම බලපැවැත්වෙන පරිදි පහත උපලේඛනයේ දැක්වෙන පරිදි කාලසීමාවක් ප්‍රකාශයට පත්කරමි.

තව ද, එම කාලසීමාව තුළ බලපත්‍ර රහිත තුවක්කු භාරදෙනු ලැබූවිට භාරදුන් දිනයට පෙර එම තුවක්කු තම භාරයේ තිබීම හෝ සන්තකයේ තිබීම හෝ පාවිච්චි කිරීම හේතුවෙන් තුවක්කු ආඥපනතේ 22 වගන්තියට පටහැනි වූ යම් වරදක් සඳහා පනවනු ලබන යම් දඩයක් හෝ දඬුවමක් සඳහා එම තුවක්කුව භාරදුන් තැනැත්තා යටත් නොවිය යුතු බවට නියම කරමි.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

1. බලපත්‍ර රහිත තුවක්කු භාරදිය යුතු ස්ථානය

   පදිංචිය අයත් පොලිස් බලප්‍රදේශයේ පොලිස් ස්ථානයට

2. කාල සීමාව

   2020 පෙබරවාරි මස 05 සිට 12 දක්වා.

02-376